චක්‍ර ලේඛ අංක 7/99

මගේ අංකය: බප/සසේකො/ලේ/කිර්
සමුපකාර සේවක කොමිෂන් සභාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1999.11.11

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

## සමුපකාර සමිතිවලට අළුතින් සේවකයන් බඳවා ගැනීම.

බස්නාහිර පළාතේ සමුපකාර සමිතිවලට අළුතින් සේවකයන් පත්කර ගැනීමේදී පහත සඳහන් කරුණු ඒ ආකාරයෙන් පිළිපැදිය යුතු බවට සමුපකාර සේවක කොමිෂන් සභාව නියෝග කර සිටී.

**(අ) 1994 අංක 01 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 18(1) වගන්තිය**

බස්නාහිර පළාත තුළ පිහිටි යම් දිස්ත්‍රික්කයක සමුපකාර සමිතියක යම් තනතුරකට යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක් වත් එම දිස්ත්‍රික්කය ඇතුලත ස්ථිරව පදිංචිව නොසිටි කිසිම තැනැත්තකු පත් නොකළ යුතු ය.

**(ආ) 1994 අංක 01 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 18(2) වගන්තිය**

කොමිෂන් සභාවේ මතය අනුව යම් දිස්ත්‍රික්කයක යම් සමුපකාර සමිතියක යම් තනතුරක් සඳහා සුදුසු අපේක්ෂකයන් එම දිස්ත්‍රික්කය තුළ නොමැති නම් බස්නාහිර පළාත තුළ පිහිටි අනිකුත් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගෙන් සුදුසු පුද්ගලයකු එම තනතුර සඳහා පත් කිරීමට අවසර දීමට කොමිෂන් සභාවට හැකි ය.

මේ වැනි අවස්ථාවලදී සමුපකාර සමිතිය පිහිටි දිස්ත්‍රික්කය තුලින් ප්‍රථමයෙන් අයදුම්පත් කැඳවූ බවටත් දිස්ත්‍රික්කය තුල එම තනතුර සඳහා සුදුසුකම් සහිත පුද්ගලයන් නොමැති බවටත්, සමුපකාර සේවක කොමිෂන් සභාවට පිළිගත හැකි සාක්ෂි සමුපකාර සමිතිය විසින් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

සටහන:- බස්නාහිර පළාත තුලින් සුදුසුකම් ඇති පුද්ගලයන් ඉදිරිපත් වී නොමැති අවස්ථාවල බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව විමසා එම කොමිෂන් සභාව විසින් දෙනු ලබන උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

**(ඇ) සමුපකාර සේවක [illegible] විධිවිධාන සංග්‍රහයේ 1.2.2 වගන්තිය**

යම් තනතුරක /තනතුරු සම්බන්ධව පුරප්පාඩු ඇති වූ විට පළමුවෙන්ම, එම තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් නියම කරන ලද වැටුප් පරිමාණ, සුදුසුකම් හා අනිකුත් විස්තර ඇතුළත් ප්‍රසිද්ධ දැන්වීමක් සමිති කාර්යාලයේ හා එහි සියලුම ව්‍යාපාරික ස්ථානවල ප්‍රසිද්ධ කිරීමෙන් අභ්‍යන්තර වශයෙන් ඉල්ලුම්පත් කැඳවිය යුතු ය.

.....02

## 2. සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහය 1:2:3 වගන්තිය

ඉහත 1:2:2 වගන්තිය අනුව සුදුසුකම් ඇති අයවලුන් සමිතියේ නොමැති බව තහවුරු වන්නේ නම්, එකී තනතුරට අදාළ වැටුප් පරිමාණය, සුදුසුකම් හා අනිකුත් විස්තර ... ප්‍රසිද්ධ දැන්වීමක් මාර්ගයෙන් බාහිර පුද්ගලයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවිය යුතු ය.

සටහන:- මෙසේ වෙනත් සමිතිවලට අනියම්, තාවකාලික, කොන්ත්‍රාත් හෝ ස්ථිර ඕන කවර පදනමක් යටතේ වුවත් තනතුරු පිරවීම සඳහා කටයුතු ආරම්භ කිරීමට පෙර සමු... සංවර්ධන කොමසාරිස් වරයා ගේ පූර්ව එකඟතාවය ලබා ගත යුතු ය.

## 3. සමුපකාර සේවක කොමිෂන් සභාව (සංශෝධන) රෙගුලාසි අංක 18

සමුපකාර සමිති විසින් සියලුම ස්ථිර පත්වීම් කළ යුත්තේ එම කාර්යය සඳහා පත් කර... ලබන තේරීම් මණ්ඩලයක නිර්දේශයන් සලකා බැලීමෙන් පසුව ය. එසේ තනතුරුවලට ... පත් කිරීමට පෙර එම තනතුරුවලට පත් කරනු ලබන පුද්ගලයන් ගේ සුදුසුකම් ද වෙ... අදාල විස්තර ද සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එම පත්කිරීම් සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

ස්ථිර පත්කිරීම්, කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම්, ගිවිසුමක් මත කෙරෙන පත් කිරීම් ... මේ කවර ආකාරයේ හෝ පත් කිරීමක් සම්බන්ධයෙන් වුවත් සමුපකාර සේවක කොමිෂ... සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය. එවැනි පූර්ව අනුමැතියක් නොමැතිව පත්... කිරීම වරදක් වන අතරම එසේ පත් කරනු ලබන්නන්ට සමුපකාර සමිති අරමුදලින් වැටු... ගෙවීම ද නීතියට පටහැනි ක්‍රියාවක් වන්නේ ය.

## (4) තනතුරුවලට සේවකයන් තෝරා ගැනීම සඳහා පත් කරනු ලබන තේරීම් මණ්ඩල

සමුපකාර සමිතිවලට සේවකයන් බඳවා ගැනීමේදී පත් කරනු ලබන තේරීම් මණ්ඩල පහත ... සඳහන් ආකාරයට සංස්ථාපනය විය යුතු බවට සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර තිබේ.

1. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හෝ සභාපති වෙනුවෙන් වෙනත් අධ්‍යක්ෂවරයකු (සභාප...
2. සමුපකාර සමිති පරීක්ෂක හෝ ඔහුට සහභාගී වීමට නොහැකි අවස්ථාවල ප්‍රදේශය ... සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් නම් කරනු ලබන වෙනත් නියෝජිත...
3. රජයේ දෙපාර්තමේන්තුවක හෝ වෙනත් සමුපකාර සමිතියක විධායක මට්ටමේ නිලධාරියෙක්.

- රියැදුරු, යතුරු ලේඛක, ලඝුලේඛක වැනි විශේෂ තනතුරුවලට සේවකයන් බඳවා ගැනීමේදී එම විෂයය පිළිබඳව විශේෂඥ පළපුරුද්දක් හා දැනීමක් ඇති රජයේ දෙ... රාජ්‍ය සංස්ථාවක [illegible] නිලධාරියෙක් හෝ සමුපකාර සමිතියක විධායක මට්ටමේ නිලධාරියෙක්

## ප්‍රායෝගික පරීක්ෂණ

රියැදුරු, යතුරු ලේඛන, ලඝුලේඛන, වැනි විශේෂ තනතුරුවලට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු මූලික සුදුසුකම් ඇති සියලු දෙනාම ප්‍රායෝගික පරීක්ෂණයකට සහභාගි කරවිය යුතු අතර එම ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු ද සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවලට එකතු කර සුදුස්සන් තේරීම කළ යුතු ය.

## ලකුණු ලබා දීම

සම්මුඛ පරීක්ෂණයේදී ලබා දිය යුතු ලකුණු තීරණය කරන විට මුළු ලකුණු ප්‍රමාණයෙන් 25% කට නොඅඩු ප්‍රමාණයක් අපේක්ෂකයා ගේ අධ්‍යාපන සුදුසුකම්වලට ද 25% කට නොඅඩු ප්‍රමාණයක් සේවා කාලයට ද තවත් 25% ක් සමුපකාර විෂයය සම්බන්ධව සමත් වී ඇති විභාගවලින් ලබාගත් සහතිකවලට සහ සමුපකාර විෂයයට අදාලව සහභාගි වූ පුහුණු පාඨමාලා සම්බන්ධයෙන් ලබා ගත් සහතිකවලට ද වෙන් කළ යුතු ය. ඉතිරි ලකුණු ප්‍රමාණය වෙනත් කරුණු වෙනුවෙන් ලබා දිය හැකි ය.

අධ්‍යාපන සුදුසුකම් වලට වෙන් කරනු ලබන මුළු ලකුණු ප්‍රමාණයෙන් 50% අවම අධ්‍යාපන සුදුසුකම්වලට ලබා දිය යුතු අතර ඉතිරි 50% අවම අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා තිබෙන අධ්‍යාපන සුදුසුකම් සඳහා සිසියම් පදනමක් මත ලබා දීමට කටයුතු කළයුතු ය. ඒ ආකාරයෙන් අවම අධ්‍යාපන සුදුසුකම් වලට වැඩි වෙනත් අධ්‍යාපන සුදුසුකම් වලට ලකුණු ලබා දුන් පදනම සම්මුඛ පරීක්ෂණ සටහන්වල පැහැදිලිව ඇතුලත් කළයුතු ය.

උදාහරණයක් වශයෙන් මූලික අධ්‍යාපන සුදුසුකම් අ.පො.ස. සා.පෙළ විෂයයන් 06 කින් සමත් වීම සඳහන් වී තිබේ නම් ඒ සඳහා ලකුණු 12.5 ක් ලබා දිය යුතු අතර උසස් පෙළ සමත් වී තිබේ නම් තවත් ලකුණු කිහිපයක් ඒ වෙනුවෙන් ද උපාධි ලැබ තිබේ නම් උපාධිය වෙනුවෙන් ලකුණු කිහිපයක් ද ලබා දිය යුතු ය.

සේවාකාලය සඳහා ලබා දෙන ලකුණුවලින් 50% බඳවා ගැනීමේ පටිපාටියට අනුව අවශ්‍ය අවම සේවා කාලයට ලබා දිය යුතු අතර ඊට වැඩි පළපුරුද්දක් තිබේ නම් ඒ සඳහා අතිරේක ලකුණු ලබා දිය හැකි ය. පළපුරුද්දට ලකුණු ලබා දීමේදී පූර්වපාදුව පවතින ශ්‍රේණිය හමගව ඊට ඉහලින් තිබෙන ශ්‍රේණියේ සේවා කාලය අවශ්‍ය අවම සේවා කාලය වශයෙන් ගණන් ගත යුතු ය. උදාහරණයක් වශයෙන් 09 වන වැ.ප. තනතුරකට අයදුම්පත් ඉදිරිපත් කිරීමට 10 වන වැ.ප. වර්ෂ දෙකක් හෝ 11 වන වැ.ප. වර්ෂ හතරක් ඇති අයෙකුට හිමිකම් තිබේ. මෙහිදී අවම සේවා කාලය වශයෙන් ගණන් ගත යුත්තේ 10 වන වැටුප් පරිමාණයේ වර්ෂ දෙකක සේවා කාලයයි. ඒ අනුව 10 වන වැ.ප. වර්ෂ දෙකක් සේවය කර ඇති අයකුට ලකුණු 12.5 ලැබෙන අතර ඔහුට තවත් වර්ෂ හයක සේවා කාලයක් තිබේ නම් වර්ෂයකට ලකුණු 01 බැගින් අතිරේක ලකුණු 06 ලබා ගැනීමට හිමිකම් තිබේ. 11 වන වැ.ප. සේවකයෙක් අයදුම්පතක් ඉදිරිපත් කර ඇත්නම් අවම සේවා කාලය සඳහා ලැබෙන ලකුණු 12.5 ඔහුට ලබා ගැනීමට හිමිකමක් නැත. එහෙත් ඔහුගේ මුළු සේවා කාලයටම 01 ලකුණ බැගින් ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබේ.

එ. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අපේක්ෂකයන් තීරණය කිරීම

කිසියම් තනතුරක් සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව මූලික සුදුසුකම් ඇති අපේක්ෂක වෙනම ම තෝරා ඔවුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට කටයුතු කළයුතු ය. සුදුසුකම් නොමැති කිසිම අපේක්ෂකයෙක් සම්මුඛ පරීක්ෂණය සඳහා නො කැඳවීමට ව ගත යුතු ය.

ඒ. තේරීම් මණ්ඩලයට ගෙවීම් කිරීම

තේරීම් මණ්ඩල සාමාජිකයන්ට පහත සඳහන් ආකාරයට ගෙවීම් කිරීම සමුපකාර සේව කොමිෂන් සභාව අනුමත කරනු ලැබේ.

අ. විධායක ශ්‍රේණියේ තනතුරුවලට අපේක්ෂකයන් තෝරා ගැනීමේදී සම්මුඛ පරීක්ෂ ඉදිරිපත් වන එක් අපේක්ෂකයකු වෙනුවෙන් රු. 20/- බැගින් ගෙවීමක් ලබා සෑම තේරීම් මණ්ඩල සාමාජිකයකුටම හිමිකම් තිබේ.

ආ. සෙසු තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන එක් අපේක්ෂකයකුට බැගින් මුදලක් සෑම තේරීම් මණ්ඩල සාමාජිකයකුටම ලබා ගැනීමට හිමිකම් තිබේ

ඔ. අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ලියවිලි ඉදිරිපත් කිරීම

සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දින සිට දින 30 ක් ගත වීමට ප්‍රථම සමුපකාර සේව විධිවිධාන සංග්‍රහයේ 1:4:4 ඡේදයේ දැක්වෙන ආකාරයට ලියවිලි සකස් කර අනු සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. ලේඛන ඉදිරිපත් කරන අවස්ථාවේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්වීම් සඳහා නිර්දේ ලබන අපේක්ෂකයන් ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලියවිලිව ඔවුන් ගේ අයදුම්පත්වල ඡායා පිටපත් ද අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු ය. අපේක්ෂකයන් ගේ අයදුම්පත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නැත.

සම්මුඛ පරීක්ෂණයේදී තේරීම් මණ්ඩලය විසින් මුලින් ම තෝරා ගෙන ඇති අපේක් තනතුර භාර නො ගැනීම නිසා හෝ වෙනත් විශේෂ හේතුවක් නිසා හෝ පත්වීම් සඳහා තෝරා නො ගැනීමටත් ඊට අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන ඇති තැනැත්ත ලබා දීම සඳහා තෝරා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලැබුවහොත් ඒ ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අය තෝරා ගැනීමට තුඩු දුන් විශේෂ හේතුව අධ්‍යක්ෂ තීරණයේ පැහැදිලිව සඳහන් කිරීමට කටයුතු කළ යුතු ය.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කො තුමා ගේ ද එකඟතාවය ඇතිව ය.

කේ. එච්. විමලවීර,
ලේකම්,,
සමුපකාර සේවක කොමිෂන් සභා
බස්නාහිර පළාත

......./ 05